Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය:- ශිල්ප කලා

සතිය- 09

ශ්‍රේණිය :- 11

Prepared by-කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

**<u>පාඩම:- උත්සව අවස්ථා සඳහා මල් සැකසුම් නිර්මාණය කරයි.</u>**

11ශ්‍රේණිය පෙළ පොතේ පිටු අංක 153-158 දක්වා මෙම පාඩම හොඳින් අධ්‍යයනයෙහි යෙදී පහත සඳහන් අභ්‍යාසවල නිරතවන්න.

- පහත දැක්වෙන්නේ විවිධ අවස්ථා සඳහා යොදා ගන්නා මල් සැකසුම් කිහිපයකි.ඒවා හොඳින් නිරීක්ශණය කරන්න.



1. මල් සැකසුම් භාවිත කළ හැකි විවිධ උත්සව අවස්ථා නම් කරන්න.
2. මල් සැකසුම් සඳහා භාවිත කරන උපකරණ හා ද්‍රව්‍ය කිහිපයක් පහත සඳහන්වේ.ඒවායින් ඇති ප්‍රයෝජන ලියන්න.
   පොදු අත් අඬුව ,කතුර ,සෙකටියරය ,පුළුන් ,ගම්ටේප් ,වෙට්ෆෝම් ,ඩ්‍රයිෆෝම් ,කම්බි ,ගම් වර්ග
3. මල් සැකසුම් නිර්මාණය කිරීම සඳහා යොදා ගන්නා විවිධ මල් වර්ග හා කොළ වර්ග නම් කරන්න.
4. ස්වාභාවික මල් දීර්ඝ කාලයක් තබා ගැනීම සඳහා විවිධ උපක්‍රම අනුගමනය කරයි.ඒවා සඳහන් කරන්න.
5. මනාලියකගේ මල් කළඹ නිර්මාණය කිරීමේදී නිර්මාණකරුවන් යොදා ගන්නා මල් පොකුරු වල හැඩ හඳුන්වන නම් පහත දැක්වේ.ඒවායේ දළ රූප සටහන් අඳින්න.
   *දිගැටි හැඩය *අශ්ව ලාඩමක හැඩය *අයිඩ්‍රොප් හැඩය *හදවත් හැඩය *පෝසි හැඩය *ආම්ස්ට්‍රෝ හැඩය
6. පහත දැක්වෙන පියවර අනුගමනය කරමින් ස්වභාවික මල් භාවිත කර දිගැටි හැඩයේ මල් කළඹක් සකස් කරගන්නා ආකාරය පැහැදිලි කරන්න.
   - අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ
   - මල් / කොළ කල් තබා ගැනීමේ ක්‍රමවේද
   - මල් හා කොළ වලට කම්බි යෙදීම
   - මල් කිනිති සකස් කිරීම
   - මල් කළඹ නියමිත හැඩය අනුව සකස් කර නිමා කිරීම
7. මනාලියකගේ මල් කළඹක් සකස් කිරීමේදී සැලකිය යුතු කරුණු මොනවාද?